# ANTRAL WASHOUT



1. ඔබගේ හිස් කබලේ නාසය දෙපස වායු කුහර රාශියක් පිහිටා ඇත. මේවා සියල්ලම සිදුරු වලින් නාසයට විවෘත වේ. ආසාදනයකින් මෙම සිදුරු අවහිරවූ විට කුහර තුල සෙම එකතුවී පැසවීම නිසා, හිසරදය, නොකඩවා සොටු ගැලීම, නාසයෙන් ලේ යාම, වැනි රෝග ලක්ෂණ ඇති වේ. මේ සෙම ශල්‍යකර්මයකින් ඉවත්කල යුතු අවස්ථා ඇත. ඔබ ලඟ ඇති X කිරණ වාර්තාවද රැගෙන ආයුතුය.

2. නාසය ඇතුලත බෙහෙතක් ආලේපකර නාසය නිර්වින්දනය කර කටුවකින් පීනස් කුහර බිත්තිය සිදුරු කරනු ඇත. මෙහිදී ඔබට වේදනාවක් නොදැනේ. සිරින්ජයකින් සෙම ඉවත්කර බැක්ටීරියා පරීක්ෂණයට, රසායනාගාරයට යැවෙනු ඇත. කටුව තුලින් සේලයින් යවා සෙම සම්පූර්ණයෙන්ම ඉවත්වනතුරු නාසය සෝදනු ඇත. මෙහිදී කටට අපිරිසිඳු සේලයින් ගලා එනවිට ඔබට දී ඇති බඳුනට **සෙමින්** කෙලගසා ඒවා ඉවත් කිරීමට උදව් කරන්න.

3. ශල්‍යකර්මයට පසු නාසය තුලින් ලේ මිශ්‍ර දියරයක් ටික වේලාවක් ගලායන බැවින් ගෝස් කෑල්ලකින් නාසය මිරිකාගෙන ටික වේලාවක් සිටිය යුතුය.

4. සෙම වාර්තාවට අනුව ප්‍රතිජීවක දියයුතු බැවින් දින 3කට පසු රසායනාගාර වාර්තාව වෛද්‍යවරයාට පෙන්වන්න.